උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ සංවර්ධන ව්‍යාපෘතියේ (වැඩසටහන් සංරචකය) - 2020

---

උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතියේ (වැඩසටහන් සංරචකය) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය උදෙසා වන ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ජුලි 17 දින එළඹි අංක 8743 එල්කේ දරන ණය ගිවිසුමේ හා අංක 6026 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 4.09(ආ) ව්‍යවස්ථා සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය හා මූල්‍ය ගිවිසුම්වලට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර රජයේ විශ්වවිද්‍යාල සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ වෛද්‍ය අංශවල ප්‍රමුඛ විෂයයන්ට රජයේ විශ්ව විද්‍යාලවලට, ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීම වැඩිකිරීම, උපාධි වැඩසටහන්වල ගුණාත්මකබව වැඩිදියුණු කිරීම හා උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ හා නව සොයා ගැනීම් දිරිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය සහ මූල්‍ය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,136 කට සමාන එජඩො මිලියන 100 මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 මාර්තු 01 දින ආරම්භ කරන ලද අතර 2023 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශචය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී., තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම

-----------------------------------------------

විශ්වවිද්‍යාල 15න්ම තොරතුරු කැදවා ඇත - OTS සහ SLIATE. කෙසේවෙතත්, කොළඹ විශ්වවිද්‍යාලයේ, මොරටුව විශ්වවිද්‍යාලයේ, රජරට විශ්වවිද්‍යාලයේ, සබරගමුව විශ්වවිද්‍යාලයේ, අග්නිදිග විශ්වවිද්‍යාලයේ, සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනවල මෙහෙයුම් තාක්ෂණික ලේකම්කාර්යාල (OTS ) තොරතුරු ඉදිරිපත් කිරීමට අසමත්වී තිබුණි.

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| **2019 ඔක්තෝබර් 11** දිනැති අංක ඒඑච්ඊඒඩී/එෆ්අයිඑන්/**2019/28** දරන චක්‍රලේඛය මගින් ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී වාර්ෂිකව දරන සියලුම වියදම් වාර්තා කිරීමට ව්‍යාපෘති කළමණාකරු විසින් දෙන ලද උපදෙස් සමග උප කුලපතිවරු අනුගත වී නොතිබුණු අතර මෙහෙයුම් සහ අධීක්ෂණ සහය කණ්ඩායමේ (OMST) ශේෂ පත්‍රය සහ මෙහෙයුම් තාක්ෂණික ලේකම්කාර්යාල (OTS) විසින් දරන ලද වියදම පමණක් ඔවුන් සලකා තිබුණි. එමනිසා, **2020** දෙසැම්බර් **31** දිනට මෙහෙයුම් සහ අධීක්ෂණ සහය කණ්ඩායම (OMST) විසින් වාර්තා කරන ලද ශේෂයන් එම විශ්ව විද්‍යාල සමග සත්‍යාපනය කිරීමට නොහැකි විය. අහඹු විගණන පරීක්ෂණ තුළදී මෙහෙයුම් සහ අධීක්ෂණ සහය කණ්ඩායම (OMST) ශේෂයන් සහ මෙහෙයුම් තාක්ෂණික ලේකම්කාර්යාල (OTS) ශේෂ අතර පහත වෙනස්කම් නිරීක්ෂණය විය. | එකග වේ. මෙම වෙනස්කම් සඳහා හේතු කිහිපයක් තිබේ. | සත්‍ය වියදම වාර්තා කළ යුතුය. |

| විශ්වවිද්‍යාලයේ නම | **OMST සහ OTS** ශේෂ අතර වෙනස |
|---|---:|
| ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | **458** |
| යාපනය විශ්ව විද්‍යාලය | **381** |
| කැළණිය විශ්ව විද්‍යාලය | **116** |
| ඌව විශ්ව විද්‍යාලය | **198** |
| වයඹ විශ්ව විද්‍යාලය | **9** |
| එකතුව | **1,162** |

**2.2.** රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | වැඩසටහන් ඇගයුම් ලේඛණය- මූල්‍ය කළමනාකරණය ගිවිසුම | **2018** දෙසැම්බර් **31** වන විට OMST සහ විශ්ව විද්‍යාලවල ලෝක බැංකුව මූල්‍යකරණය කටයුතු සඳහා ස්වංක්‍රීය ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපනය කළ යුතුය. කෙසේවෙතත්, **2021** අප්‍රේල් **30** දින වන විට OMST වල පමණක් පද්ධතිය කර තිබුණු නිසා මෙම අවශ්‍යතාවය සමග අනුකූල වී නොතිබුණි. | මේ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන **17**ක් විය. එම නිසා ක්‍රියාත්මක කර නොමැත. | ණය ගිවිසුම සමග අනුකූල වීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | කොන්ත්‍රාත් ගිවිසුමේ දෙවැනි වගන්තිය | (i) ගිවිසුම යටතේ ප්‍රමාදවී සපයන අවස්ථාවකදී දිනකට සැපයුම් මිළෙන් සියයට 0.05 සමාන ප්‍රමාණයක් සැපයුම්කරුගෙන් අඩු කිරීම අවශ්‍ය වේ. කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10කින් කොන්ත්‍රාත්තුව අවසන් වීමට ඉඩ ඇත. එවැනි ප්‍රමාදවීම්වලට වටිනාකමේ රු. මිලියන 137,850ක මුදලක් වුවද කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට ව්‍යාපෘතිය පියවර ගෙන නොතිබුණි. | කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් විශ්ව විද්‍යාල 2020 මාර්තු සිට ජූනි දක්වා වසා දමන ලදි. වැඩ කරන්නන්, කර්මාන්තශාලා සහ සැපයුම්කරුවන් මෙයින් බලපෑමට ලක්වූ අතර එම නිසා ප්‍රමාද හානි අයකර නොතිබුණි. | |
| | | (ii) යාපනය විශ්ව විද්‍යාලයේ වවුනියාව මණ්ඩපය සඳහා රුපියල් මිලියන1.3කට (Gel Documentation system) පද්ධතියක් ඇණවුම් කර තිබුණු අතර ඇණවුම් කළ දින සිට මාස 3ක ප්‍රමාදයකින් පසුව සැපයුම කර ඇත. කෙසේවෙතත්, ප්‍රමාදහානි අයකර නොතිබුණි. | දීර්ඝ කිරීම් ලබා දී ඇත. | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි සමග අනුකූල වීමට සැපයුම්කරුවන් පෙළඹවීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ භාණ්ඩ සහ වැඩ 1.4.4 වගන්තිය | ලැප්ටොප් 132ක් සමග සැපයුම්කරු විසින් නොමිලේ එච්පී බිස්නස් හෙඩ්සෙට්, එච්ඩීඑම්අයි වීජීඒ ඇඩප්ට සහ යූඑස්බී-එල්පී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ලැබී තිබුණි. මෙම අයිතම භාණ්ඩ ලැබීමේ තුණ්ඩවේ වාර්තාකර හෝ බඩු වට්ටෝරු පොතෙහි ඇතුළත්කර නොතිබුණි. | සැපයුම්කරුගෙන් නොමිලේ ලැබුණු භාණ්ඩවල වටිනාකම විශ්ව විද්‍යාලය දැනටමත් ලබාගෙන ඇති අතර දැන් එම අයිතම ගිණුම්වලට ගැනීමේ ක්‍රියාවලියේ පවතී. | නොමිලේ ලැබුණු භාණ්ඩ බඩු වට්ටෝරු පොතෙහි ඇතුළත් කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 කටයුතු පිළිබඳ භෞතික මූල්‍ය ප්‍රගතිය

ව්‍යාපෘති සංරචකය සහ වැඩසටහන් සංරචකය යනා දී සංරචක 2ක් යටතේ උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතියේ මෙහෙයුම් සිදුකරනු ලැබේ.

වැඩසටහන් සංරචකය ප්‍රතිඵල කලාප 3ක් සහ වියපැහැදම් සම්බන්ධ දර්ශක 6ක් යටතේ මෙහෙයවනු ලැබේ. විස්තර පහත දැක්වේ.

වැඩසටහන් සංරචකය

ප්‍රතිඵල කලාප 1 - ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රමුඛතා විෂයයන් සඳහා උසස් අධ්‍යාපනයට ඇතුලත් වීම වැඩි කිරීම.

ප්‍රතිඵල කලාප 2 - උසස් අධ්‍යාපනයේ ගුණත්වය වැඩි කිරීම.

ප්‍රතිඵල කලාප 3 - පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම

ව්‍යාපෘති සංරචකය- මෙහෙයුම් සහ නියාමන සහය

| | සංරචකය/ උප සංරචකය | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ------------ | --------------- | ------------------------ | -------------------- |
| (අ) | ප්‍රතිඵල කලාප - 1 | විශ්ව විද්‍යාල 11ක් සඳහා වෙන්කරන ලද රු. මිලියන 2,267කින් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 46ක් හෝ රු.මිලියන 1,050ක් පමණක් උපයෝජනය කර තිබුණි. | ප්‍රතිපාදන /ප්‍රදාන වට තුනකට අනුමත විය. පළමු වටය දෙක 2018 අවසානයේදී සහ 2019 මැදදී අනුමත වූ අතර වර්තමානයේ සම්පූර්ණයෙන්ම උපයෝජනය කර ඇත. 2020 අනුමත වූ ප්‍රදාන සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර ඇත. ප්‍රසම්පාදනයේ ප්‍රගතියට වසංගතය බලපාන ලදි. ප්‍රමාණවත් නොවන අයවැය ප්‍රතිපාදන මූල්‍ය හා භෞතික ප්‍රගතියට බලපා ඇත. | විශ්ව විද්‍යාලය විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් අවශ්‍ය වේ. |
| (ආ) | සිවිල් කටයුතු | සිවිල් කටයුතු සඳහා කරන ලද රු. මිලියන 3,623ක මුළු ප්‍රතිපාදන මුදලින් අඩු වශයෙන් සියයට 69.9ක් විදම් කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හැර 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදන මුදලින් සියයට 39ක් අඩුවෙන් අනෙකුත් සියළුම විශ්ව විද්‍යාල උපයෝජනය කර තිබුණි. | යාපනයේ ගොඩනැගිලි දෙකකි. එකක් 60% නිමකර ඇත. අනෙක් එක ආරම්භ වුවා පමණි. ජයවර්ධනපුර ගොඩනැගිලි දෙකකි. එකක් නිමකර ඇත. අනෙක ආරම්භ කර ඇත. පේරාදෙනියේ ගොඩනැගිලි දෙකකි. එකක් දැනටමත් නිමකර ඇත. අනෙක් එක ආරම්භ වුවා පමණි. රුහුණ ඉදිකිරීම්වලින් 50% වැඩියෙන් නිම කර ඇත. ඌව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට නියමිතය. වයඹ ගොඩනැගිලි දෙකකි. එකක් නිමකර ඇත. අනෙක ඉදිකරමින් පවතී. SLIATE ගොඩනැගිලි දෙකකි. ඉදිකිරීම් මෑතකදී ආරම්භ කර ඇත. | විශ්ව විද්‍යාලය විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් අවශ්‍ය වේ. |
| (ඇ) | පීඑච්ඩී වැඩසටහන් | පීඑච්ඩී වැඩසටහන සඳහා කරන ලද රු.මිලියන 1,749ක මුළු ප්‍රතිපාදන මුදලින් 2020 දෙසැම්බර් 31 දිනට වෙන්කරන ලද මුදලින් සියලුම විශ්වවිද්‍යාල සියයට 43 වඩා අඩුවෙන් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. | 2018 සිට 2020 දක්වා වට 3කදී ශිෂ්‍යත්ව ප්‍රදානය කර ඇත. ඉලක්ක අත්පත් කරගෙන ඇත. ප්‍රදානලාභීන් බොහෝ දෙනකු අධ්‍යනයන් ආරම්භ කර ඇත. සංචරන සීමා සමහර ප්‍රතිලාභීන්ගේ අධ්‍යනයන් ආරම්භ කිරීමට ප්‍රමාද වී තිබුණි. | විශ්ව විද්‍යාලය විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් අවශ්‍ය වේ. |

**3.2 ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/නිමකිරීමේ ප්‍රමාදයන්**

| | ක්‍රියාකාරකම | ආරම්භ කිරීමට, ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ දිනය | නිම කළ දිනය | ප්‍රමාදය | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| (අ) | වැඩසටහන් ඇගයුම් ලේඛනයට අනුව, පූරවැසි නියැලීම- අධීක්ෂණ හා ඇගයීම සඳහා ලෝක බැංකුව වෙත ඇල්මඇති පාර්ශවයන්ගේ උපදේශන වාර්තා ඉදිරිපත් කළ යුතුය. | 2018 දෙසැම්බර් 31 | සමීක්ෂණය පමණක් 2020 වර්ෂයේදී ආරම්භ කර තිබුණු බව නිරීක්ෂණය විය. | වර්ෂ දෙකක ප්‍රමාදයන් සමග ආරම්භ කර තිබුණු අතර 2020 දෙසැම්බර් 30 දින ලෝක බැංකුව වෙත අවසන් වාර්තාව ඉදිරිපත් කර තිබුණි. | ඇල්ම ඇති පාර්ශවයන්ගේ තෘප්තිය පිළිබඳ සමීක්ෂණය 2021 ජූනි ආරම්භ කර ඇත. ප්‍රමාදය කොවිඩ් නිසා අගුළු දැමීම හේතුවෙන් වේ. | ණය ගිවිසුම සමග අනුකූල වීම අවශ්‍ය වේ. |
| (ආ) | ප්‍රතිලාභීන්ගේ තෘප්තිය පිළිබඳ මූලික සමීක්ෂණය | 2019 පෙබරවාරි 14 | රු.මිලියන 6ක පිරිවැයක් සමග 2021 පෙබරවාරි 15 දින නිමකර ඇත. | වර්ෂයක ප්‍රමාදයකින් පසුව 2020 පෙබරවාරි 10 දින ආරම්භ කර ඇත. | සමීක්ෂණය නිමකර 2020 දෙසැම්බර් ඉදිරිපත් කර ඇත. | ණය ගිවිසුම සමග අනුකූල වීම අවශ්‍ය වේ. |
| (ඇ) | යාපනය විශ්ව විද්‍යාලයේ කලා පීඨයේ ELTA ELSE පීඨය මට්ටම් සංවර්ධනය යටතේ රු. මිලියන 4.8 පිරිවැයකට සම්මන්ත්‍රණ ශාලාව ස්ථාපනය කිරීම | 2020 දෙසැම්බර් 30 | 2021 අප්‍රේල් 15 දින නිම කිරීමට අපේක්ෂිත විය. | කටයුතු නිමකර නොතිබුණි. | 85% කටයුතු නිමකර ඇත. | කොන්ත්‍රාත්කරුවන් ගේ කටයුතු කාර්යක්ෂම ආකාරයට අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| (ඈ) | ELTA ELSE පීය මට්ටම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යාපනය විශ්ව විද්‍යාලයේ කලා පීඨයේ රු.මිලියන 2.17ක පිරිවැයකට සුහුරු පංති කාමර 15ක් ස්ථාපනය කිරීම. | 2020 දෙසැම්බර් 17 | 2021 මාර්තු 12 දින නිම කිරීමට අපේක්ෂිත විය. | කටයුතු නිමකර නොතිබුණි. | 2020 දෙසැම්බර් 30 දින ගිවිසුම් අත්සන් කර ඇත. කටයුතු වලින් 80%ක් නිමකර ඇත. | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඉ) | ELTA ELSE පීඨ මට්ටම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යාපනය විශ්ව විද්‍යාලයේ කලා පීඨයේ රු.මිලියන 7.32ක පිරිවැයකට ඉ - ඉගැනුම් කලාපයක් ස්ථාපනය කිරීම අවශ්‍ය වේ. | 2020 සැප්තැම්බර් 09 | 2020 දෙසැම්බර් 09 දින නිම කිරීමට අපේක්ෂිත විය. | 2021 මැයි 05 දින වන විටත් අවසන් බිල්පත නිරවුල් කර නොතිබුණි. | 90%ක් කටයුතු නිමකර ඇත. | -එම- |
| (ඊ) | ELTA ELSE පීඨ මට්ටම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යාපනය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ රු.මිලියන 1.38ක පිරිවැයකට සමාජ සුභසාධන මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය වේ. | 2020 නොවැම්බර් 04 | 2021 ජනවාරි 04 දින නිම කිරීමට අපේක්ෂිත විය. | කටයුතු නිමකර නොතිබුණි. | කටයුතු නිමකර ඇති අතර බිල්පත් ඉදිරිපත් කිරීමට අපේක්ෂිත විය. | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි සමග අනුකූලවීම කොන්ත්‍රාත්කරුවන් පෙළඹවීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (උ) | ELTA ELSE පීඨ මට්ටම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යාපනය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ රු.මිලියන 16.32ක පිරිවැයකට පවතින පංති කාමර අලුත්වැඩියා කිරීමට අවශ්‍ය වේ. | 2020 පෙබරවාරි 26 | 2020 අප්‍රේල් 25 දින නිම කිරීමට අපේක්ෂිත විය. | කටයුතු නිමකර නොතිබුණි. | 80%ක් කටයුතු නිමකර ඇත. | - එ ම - |
| (ඌ) | ELTA ELSE පීඨ මට්ටම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යාපනය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ රු. මිලියන 3.32ක පිරිවැයකට බොයිලර් ඒකකය, තාරා ඒකකය, බිත්තර රකින ඒකකය, හාවන් | 2020 අගෝස්තු 20 | 2020 ඔක්තෝබර් 19 දින නිම කිරීමට අපේක්ෂිත විය. | කටයුතු නිමකර නොතිබුණි. | කටයුතු නිමකර ඇත. බිල්පත් ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය. 2021 මැයි 31 දක්වා දීර්ඝ කිරීම් ලබාදී ඇත. | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ඒකකය, හරක් පැටවුන් ඒකකය අලුත්වැඩියා කිරීමට අවශ්‍යවේ. | | | | | |
| (එ) | RA3- DOR යටතේ යාපනය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය රු. මිලියන 7.31ක පිරිවැයකට සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පාරිසරික සහ ක්ෂුද්‍ර ජීව විද්‍යා විද්‍යාගාරය අලුත්වැඩියාව සහ ප්‍රතිව්‍යුහගත කිරීම | 2020 පෙබරවාරි 19 | 2020 අප්‍රේල් 30 දින නිම කිරීමට අපේක්ෂිත විය. | කටයුතු නිමකර නොතිබුණි. | කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට පියවර ගනිමින් සිටී. | -එම- |
| (ඒ) | යාපනය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ 3වන වටය යටතේ- STEM රු.මිලියන 2.26ක පිරිවැයකට eight tower model වැඩ ඒකකය මිළදී ගැනීම. | 2020 දෙසැම්බර් 07 | 2021 ජනවාරි 07 සැපයුම් කිරීමට සැලසුම් කර ඇත. | මෙම අයිතම් සපයා නොතිබුණි. | භාණ්ඩ සපයා තිබුණු අතර 2021 මැයි 13 දින ගෙවීම් සිදුකර ඇත. | -එම- |
| (ඔ) | යාපනය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ 3වන වටය යටතේ- STEM රු.මිලියන 1.9ක පිරිවැයකට ඇඹරීමේ සහ ඔපදැමීමේ ලෝහ ආකෘතිය මිළදී ගැනීමට අවශ්‍ය වේ. | 2020 නොවැම්බර් 06 | 2020 දෙසැම්බර් 21 සැපයුම් කිරීමට සැලසුම් කර ඇත. | සමහර උපාංග රහිතව 2021 ජනවාරි 07 දින අයිතමය සපයා ඇත. | ඉතිරි උපාංග සපයා ඇති අතර 2021 මැයි 13 දින ගෙවීම් සිදුකර ඇත. | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඕ) | යාපනය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ 3වන වටය යටතේ- STEM රු.මිලියන 1.9ක පිරිවැයකට eight tower model පරිගණක මිළදී ගැනීමට අවශ්‍ය වේ. | 2020 නොවැම්බර් 06 | 2020 දෙසැම්බර් 04 සැපයුම් කිරීමට සැලසුම් කර ඇත. | මෙම පරිගණක සපයා නොතිබුණි. | භාණ්ඩ සපයා තිබුණු අතර 2021 මැයි 13 දින ගෙවීම් සිදුකර ඇත. | -එම- |
| (ක) | යාපනය විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ධාරව වව්නියා මණ්ඩපයේ වට 2 RA 1 යටතේ රු.මිලියන 1.7ක පිරිවැයකට වායු සමීකරණ යන්ත්‍ර (60KBTU) හතරක් මිළදී ගැනීමට අවශ්‍ය වේ. | 2020 ජුලි 31 | 2020 සැප්තැම්බර් 04 සැපයුම් කිරීමට සැලසුම් කර ඇත. | වායු සමීකරණ යන්ත්‍ර 04 සැපයීමේ ප්‍රමාදයක් පවතී. | භාණ්ඩ සපයා ඇති අතර ස්ථාපනය කර ඇත. ගෙවීම් සිදු කරමින් පවතී. | -එම- |
| (ග) | රු.මිලියන 4.1ක කොන්ත්‍රාත් වටිනාකමකට ඩෙක්ස්ටොප් පරිගණක 60ක් මිළදී ගැනීමට ගිවිසුම් අත්සන් කර ඇත. | 2020 සැප්තැම්බර් 18 | 2020 ඔක්තෝබර් 20දින සැපයුම් කිරීමට සැලසුම් කර ඇත. | 2020 මාර්තු 31 දින වනවිටත් අයිතමයන් සපයා නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පසු විපරම් කරනු ලබන අතර අවශ්‍ය පියවර ගනු ලැබේ. | -එම- |

**3.3 ඌනඋපයෝජිත සම්පත්**

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | ව්‍යාපෘති සංරචකයට ණය නියෝජිතායතනය කරන ලද රු.මිලියන 1,270කට සමාන එ.ජ.ඩො මිලියන 7ක මුළු ප්‍රතිපාදනයෙන්, 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 495.19ක් පමණක් උපයෝජනය කර තිබුණි. | 2020.12.31 දිනට ප්‍රතිපාදන එරෙහිව මුළු වියදම් එ.ජ.ඩො මිලියන 3.39ක් විය.(උපයෝජනය 48%කි) 2018 දී විනිමය අනුපාතය රු.157.83 සහ 2020 දෙසැම්බර් රු. 186ක් විය. එ.ජ.ඩො වලින් වියපැහැදම් මත ප්‍රගතිය ගණනය කිරීම වඩාත් සුදුසු වේ. | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සදහන් ඉලක්ක සමග අනුකූල වීමට පියවරගත යුතුය. |
| (ආ) | වැඩසටහන් සංරචකයට ණය නියෝජිතායතනය කරන ලද රු.මිලියන 16,867කට සමාන එ.ජ.ඩො මිලියන 93ක මුළු ප්‍රතිපාදනයෙන්, 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 5,527.23ක් පමණක් උපයෝජනය කර තිබුණි. | 2020.12.31 දිනට ප්‍රතිපාදන එ.ජ.ඩො මිලියන 93ට එරෙහිව මුළු වියදම් එ.ජ.ඩො මිලියන 38.10ක් විය.(උපයෝජනය 41%කි) එ.ජ.ඩො වලින් වියපැහැදම් මත ප්‍රගතිය ගණනය කිරීම වඩාත් සුදුසු වේ. | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සදහන් ඉලක්ක සමග අනුකූල වීමට පියවරගත යුතුය. |
| (ඇ) | යාපනය විශ්ව විද්‍යාලය විසින් රු.මිලියන 1.7ක පිරිවැයකට මිළදී ගන්නා ලද අන්තර් ක්‍රියාකාරී බහුමාධ්‍ය ප්‍රක්ෂේපකය 2021 දෙසැම්බර් 31 දිනට ස්ථාපනය කිරීමකින් තොරව පැවතුණි. | සිවිල් කටයුතු නිම නොකිරීම හේතුවෙන් ස්ථාපනය කිරීම ප්‍රමාද වී ඇත. | සිවිල් කටයුතු නිම කිරීමට කොන්ත්‍රාත්කරුවන් පෙළඹවීමට පියවර ගත යුතුය. |

**3.4 වැඩබිම් පරීක්ෂාවේදී කරන ලද නිරීක්ෂණ**

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය භාණ්ඩ මිළදී ගැනීම සඳහා 2020 වර්ෂය තුළදී රු.මිලියන 203ක් වටිනා කොන්ත්‍රාත් ගිවිසුම් 203කට එළඹ තිබුණි. කෙසේවෙතත්, රු.මිලියන 1ක් වටිනා කොන්ත්‍රාත් 04ක් අවලංගු කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන වලින් සියයට 31ක් නියෝජනය කරන රු.මිලියන 63ක් වටිනා කොන්ත්‍රාත් 82ක් භාණ්ඩ සැපයුම්කරු විසින් විගණන දින වූ 2021 අප්‍රේල් 22 දින වන විටත් සපයා නොතිබුණි. | භාණ්ඩ නොසැපයීම,අනුකූල වීම හෝ ලංසු මිළ ඉහල යාම හේතුවෙන් ප්‍රසම්පාදනයන් අවලංගු කිරීම සිදු කර තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි සමග අනුකූල වීමට සැපයුම්කරුවන් පෙළඹවීමට අවශ්‍ය පියවර ගතයුතුය. |
| (ආ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් රු.මිලියන 34ක් ගෙවීමක් සිදුකර තිබුණු රු.මිලියන 37ක් වටිනා භාණ්ඩ 2021 අප්‍රේල් 22 කරන ලද විගණන පරීක්ෂාව තුළදී සත්‍යාපනය කර ගැනීමට නොහැකි විය. ලැබී තිබුණු තොරතුරු අනුව, මෙම අයිතම ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස භාවිතයට ගනිමින් තිබුණු විශ්ව විද්‍යාල නේවාසිකාගාරයකට සපයා තිබුණි. | මිළදීගත් සියලුම අයිතම බඩු වට්ටෝරු පොතට ගෙන තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු සමග අනුගත විය යුතු අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

**3.5** ඌන උපයෝජිත සම්පත්

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | <u>යාපනය විශ්ව විද්‍යාලය</u><br>යාපනය විශ්ව විද්‍යාලයේ වව්නියාව මණ්ඩපයේ ව්‍යවහාරික විද්‍යා පීඨය විසින් ELTA/ELSE පීඨ මට්ටම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 5.7ක පිරිවැයකට මිළදී ගත් ඩීසල් ජෙනරේටර් ස්ථාපනය කිරීමට පියවර ගෙන නොතිබුණි. | වර්තමාන තත්ත්වය මෙම ප්‍රමාදයට හේතුවී ඇත. ජෙනරේටර් ලබා දීමට සූදානම්කර ඇති බව සැපයුම්කරු දන්වා ඇත. 2021 ජූලි 31 තෙක් දීර්ඝ කිරීම් ලබා දී ඇත. | ජෙනරේටරය ස්ථාපනය කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | යාපනය විශ්ව විද්‍යාලයේ වව්නියාව මණ්ඩපයේ ව්‍යවහාරික විද්‍යා පීඨය විසින් ELTA/ELSE පීඨ මට්ටම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.2,344,591 සහ රු.653,400 පිරිවැයකට මිළදීගත් 01 වර්ගයේ ඊතනෙට් ස්විච්ය සහ 02 වර්ගයේ හතරක් 2021 ජුනි 05 දිනවන විටත් ස්ථාපනය කර නොතිබුණි. | සැපයීම් නිමකර ඇති අතර 2021 මැයි 06 දින ගෙවීම් සිදුකර ඇත. | ස්විච් සවි කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | යාපනය විශ්ව විද්‍යාලයේ වව්නියාව මණ්ඩපයේ ව්‍යවහාරික විද්‍යා පීඨය විසින් රු.999,756ක පිරිවැයකට පීසීආර් යන්ත්‍රයක් මිළදී ගැනීමට 2020 දෙසැම්බර් 08 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. 2021 ජුනි 05 වන විටත් යන්ත්‍රය ස්ථාපනය කිරීමට පියවර ගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | සැපයීම් සිදුකර ඇති අතර අයිතම ස්ථාපනය කර ඇත. 2021 මැයි 21 දින ගෙවීම් සිදුකර ඇත. | පීසීආර් යන්ත්‍රය ස්ථාපනය කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ELTA/ELSE දෙපාර්තමේන්තු මට්ටම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යාපනය විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා දෙපාර්තමේන්තුව විසින් රු.116,100 පිරිවැයකට සීසීටීවී කැමරාවක් මිළදී ගැනීමට 2020 අගෝස්තු 14 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. 2020 සැප්තැම්බර් 01 දින අයිතම සපයා තිබුණද මාස 08කට වඩා වැඩි කාලයක් නිෂ්කාර්යයව පවතින සීසීටීවී කැමරාව ස්ථාපනයට 2021 මැයි 05 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ස්ථානය වෙනස්වීම හේතුවෙන් ස්ථාපනය ප්‍රමාද විය. එය දැන් නිමකර ඇති අතර 2021 මැයි 13 දින ගෙවීම් සිදු කර ඇත. | රසායන විද්‍යා දෙපාර්තමේන්තුවේ සීසීටීවී කැමරාව ස්ථාපනය කිරීමට පියවර ගත යුතුය. |

**3.6 පද්ධති හා පාලනයන්**

| | විගණනගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී 2020 දෙසැම්බර් 31 දිනට මෙහෙයුම් තාක්ෂණික ලේකම්කාර්යායේ (OTS) හි වියදම සලකා නොතිබුණි. | මෙය දැනටමත් පැහැදිලි කර ඇත. | 2020 දෙසැම්බර් 31 දිනට මෙහෙයුම් තාක්ෂණික ලේකම්කාර්යාලයේ වියදම වාර්තා කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | AHEAD ව්‍යාපෘතිය මගින් වාර්ෂිකව දරන ලද සියලු වියදම් වාර්තා කර නොමැත. | මෙම ගැටළුව සම්බන්ධයෙන් සියලුම විශ්ව විද්‍යාල වලට සිහිකැදවීම් යවනු ලැබේ. | මේ සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් වෙත උපදෙස් ලබා දීමට කඩිනම් පියවර ගත යුතුය. |